# පරිසර ගීතය

දෙව් ලොවද මවු බිමට දෙවැනි කොට සිතන්නමු
දෙව් ලොවේ නැති අසිරි මවු බිමේ දකින්නමු
පරිසරය රකින්නෙමු වඩන්නමු වවන්නමු
මේ පිළිනයෙන් සදා මවු බිමට බැඳෙන්නමු

වලා සිඹැ ගලා යන නදී දිය නිරතුරු ය
වන උයන් මල් උයන් පල උයන් විසිතුරු ය
සිසිලසින් පණ පොවන මඳ පවන පිවිතුරු ය
පරිසරය රැකෙන තුරු සොබාදම සුමිතුරු ය

තණ්හාව ආසාව ඇයි ද පොදි බඳින්නේ
රටේ වන සම්පතට ඇයි පොරොව නගන්නේ
සොබා දම කිපුණු දා සත්වග මැ නසින්නේ
පරිසරය රකින්නේ මුළු රට මැ රකින්නේ

මෙ මිහි මතැ වසන සත සිතෙහි මෙත වැඩේ වා !
ගහ කොළට පවා එම මෙත් සිසිල දැනේ වා !
බව භෝග සම්පතින් සතට සෙත සැදේ වා !
අපේ හුස්මෙන් පවා පරිසරය නිවේ වා !

**පරිසර ගීතයේ තනුව ජන ගී ඇසුරෙන් නිර්මිතයි**

තාලය : සුළු මැදුම් දෙතිත

පද මාලාව : අරිසෙන් අහුබුදු මහතා

තනුව : ෂෙල්ටන් ප්‍රේමරත්න මහතා